වගා ආධාර චක්‍ර ලේඛ අංකය: 26

මගේ අංකය:- සං/ව.ආ/ප්‍රති
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
තැ.පෙ. 1474,
කොළඹ.

1990.02.28 දින.

සියලුම ප්‍රාදේශීය කළමණාකරුවන් වෙත,

**පැළ සැපයීමේ ආධාර ක්‍රමය යටතේ අසාර්ථක වූ තේ ඉඩම්, තේ නැවත වගා ආධාර ක්‍රමය යටතේ සංවර්ධනය කිරීම.**

පැළ සැපයීමේ සහනාධාර ක්‍රමයට සහභාගී වී පළමු ආධාර කොටස ලබාගෙන ඇති තේ ඉඩම්වලින් කොටසක් දෙවන ආධාර කොටස ලබා ගෙන නොමැති බවත්, ඊට හේතුව එම ඉඩම්වල පැළ සැපයීම අසාර්ථක වී ඇති බවත් පෙනී ගොස් තිබේ. එහි පැරණි තේ වගාවද මේ වන විට නැවත වගා කළ යුතු තත්වයට පත්ව ඇති බැවින් ඒ සඳහා පොදු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම මෙම චක්‍රලේඛයේ පරමාර්ථය වේ.

පැළ සැපයීමේ සහනාධාර ක්‍රමයට සහභාගීවී පැළ වගාව අසාර්ථක තත්වයට පත්ව දෙවන වාරික මුදල ගෙවීමට අපොහොසත් වූ තේ ඉඩම් නැවත තේ වගාවට ඉල්ලීමක් ඉදිරිපත් වූ විට එහි නැවත වගාවට ඇති යෝග්‍යතාවය විශේෂයෙන් පරීක්ෂා කළ යුතුය. අධික ලෙස පස සෝදා යාම සහ මතුපිට පසේ තද ස්ථර පිහිටීම නිසා පැළ වගාව අසාර්ථක වීම සිදු වී නොමැති බවත්, නැවත වගාවෙන් සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකි බවටත් තහවුරු වීම අවශ්‍යය.

එවැනි ඉඩම්වල කවර හෝ කොටසක් සඳහා නැවත වගා අවසර පත්‍රයක් නිකුත් කරන අවස්ථාවල පැළ සැපයීම පිණිස මුළු ඉඩමට ගෙවන ලද ආධාර මුදල නැවත වගා ආධාර ක්‍රමය යටතේ හිමි පළමු, දෙවන සහ තුන්වන වාරික කොටස්වලින් සම්පූර්ණයෙන්ම ආපසු අයකර ගත යුතු වන අතර ඒ බව අවසර පත්‍ර ආවරණ ලිපියේ කොන්දේසියක් ලෙස සඳහන් කළ යුතුය.

ආචාර්ය සරත් බී. මනන්වත්ත
සභාපති.

පිටපත්:-
1. සාමාන්‍යාධිකාරි
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සංවර්ධන/කම්හල්/ව්‍යාපෘති)
3. කළමණාකරු (මුදල්/ව්‍යාපෘති)
4. සහකාර සාමාන්‍යාධිකාරි (සංවර්ධන)